310

Add - Director


**නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මී ඔය**

**வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் – மீ ஓய**

**Resident Project Management Office – Mee Oya**

RPM 2/1/19

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
கல்கமுவ
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

මී ඔය
ගල්ගමුව
மீ ஓய

Mee Oya
Galgamuwa


21 JAN 2019

මගේ අංකය
எனது இல. } 018/3/1/3
15My Ref No

ඔබේ අංකය
உமது இல. }
Your Ref No

දිනය
திகதி } 2018.12.27
Date

ව්‍යාපාර කළමනාකරණ කමිටු සාමාජික සියලුම
රජයේ නිලධාරි මහතුන් සියලුම ගොවි සංවිධාන
නියෝජිතවරුන් වෙත

**මී ඔය ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2018 දෙසැම්බර්**

සහභාගි වූ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | D.M.K.H.දිසානායක මයා | නෝ:ව්‍යා:කළමණාකරු | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 02 | K.W.නාරංගම්මන මයා | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 03 | H.M.K.C.හේරත් මිය | සංවර්ධන සහකාර | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 04 | M.N.A.N.කුමාරි මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 05 | Y.G.N.අමරසිංහ මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 06 | R.M.N.K.රස්නායක මිය | සංවර්ධන නිලධාරි | වාරිමාර්ග කළමනාකරණ අංශය |
| 07 | W.T.බුද්ධිරාජ් මයා | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 08 | H.L.G.G.අබේවික්‍රම මිය | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 09 | W.A.G.P.කුමාරි මිය | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 10 | P.නිරෝෂා සජීවනී මිය | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

සහභාගි වූ ගොවි නියෝජිතවරුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | K.P.ජයරත්න මයා | සභාපති | ගැමුණු ගොවි සංවිධානය |
| 02 | R.D.සෝමරත්න. මයා | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 03 | L.P.ජේමරත්න මයා | භාණ්ඩාගාරික | ගැමුණු ගොවි සංවිධානය |
| 04 | H.M.T.මුතුබංඩා මයා | ලේකම් | අභය ගොවි සංවිධානය |
| 05 | W.M.වික්‍රමසිංහ මයා | ලේකම් | ධාතුසේන ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 06 | D.කාහිදූ මයා | භාණ්ඩාගාරික | ධාතුසේන ගොවි සංවිධානය |
| 07 | W.M.පුංචිමැණිකා මිය | සාමාජික | ධාතුසේන ගොවි සංවිධානය |
| 08 | S.M.පියදාස මයා | සභාපති | මහසෙන් ගොවි සංවිධානය |
| 09 | H.H.කරුණාරත්න මයා | සභාපති | යාය 04 ගොවි සංවිධානය |
| 10 | W.H.A.සෙනවිරත්න මයා | භාණ්ඩාගාරික | යාය 04 ගොවි සංවිධානය |
| 11 | P.M.ලීලානන්ද වීරසිංහ මයා | සභාපති | යාය 05 ගොවි සංවිධානය |
| 12 | S.M.රිස්වාන් මයා | භාණ්ඩාගාරික | යාය 05 ගොවි සංවිධානය |
| 13 | W.ආරියරත්න මයා | සභාපති | යාය 06 ගොවි සංවිධානය |
| 12 | W.M.නිමල් විජේරත්න මයා | ලේකම් | පුරාණගම ගොවි සංවිධානය |
| 14 | H.M.කවුරාල මයා | භාණ්ඩාගාරික | පුරාණගම ගොවි සංවිධානය |

ආගම සිහි කිරීමෙන් අනතුරු ව මී ඔය ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 දෙසැම්බර් මස 27 වන දින පෙ:ව 9:00 ට මී ඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී ව්‍යාපාර කමිටු රැස්වීම පවත්වන ලදී.පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරණ ලදී.

<u>පසුගිය කමිටු වාර්තාව සමාලෝචනය හා එකඟතා ලබා ගැනීම</u>

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය විය.

01.ආයතන සංවර්ධන කටයුතු- සංවර්ධන සහකාර

❖ පසුගිය මාසයේ ප්‍රගතිය

| අනු අංකය | කාරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | මහ සභා පැවැත්වීම | 01 |
| 02 | කාරක සභා පැවැත්වීම | 12 |
| 03 | මුදල් සාරාංශ ලබා දීම | 16 |

❖ ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත මහ සභා /කාරක සභා

| කාරණය | ඉලක්කය | වගකීම |
|---|---|---|
| මහ සභා පැවැත්වීම | 01 | නේ:ව්‍යා:කළ/සං:සහ/සං:නි |
| කාරක සභා පැවැත්වීම | 16 | එම |
| මුදල් සාරාංශ ලබා දීම | 16 | එම |

- ඉදිරි වර්ෂයේ දී මී ඔය ව්‍යාපාරයේ නිලවරණ රැස්වීම 08 ක් පැවැත්වීමට නියමිත බවත් අදාල ගොවි සංවිධාන ඒ සඳහා සූදානම් විය යුතු බවටත් දැනුවත් කරණ ලදී.
- ගොවි සංවිධාන සඳහා පැවැත්වීමට නියමිතව තිබූ ඇගයීම් පරීක්ෂාව අදාල ආයතනවලද සහභාගීත්වයෙන් යුතුව පැවැත්වූ බවත් පවසමින් එම ගොවි සංවිධානවලට ඇගයීම් පරීක්ෂාවෙන් හිමිවූ ලකුණු මට්ටමද ප්‍රකාශ කළාය.
- මීට අමතරව 2018 වර්ෂයේ දී ගොවි සංවිධානවල පවත්වන ලද රැස්වීම පිළිබඳ සාරාංශ වාර්තාවක් ද ඉදිරිපත් කරණ ලදී.

නේවාසික ව්‍යාපාර කළමණාකරු

- 2018.12.19,20,21 දිනවල සිදු කරණ ලද ක්ෂේත්‍ර චාරිකාව සාර්ථකව සිදු කළ බවත් ඒ සඳහා සහයෝගය සහ සහභාගිත්වය ලබා දුන් ගොවි සංවිධානවලට ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කළේය.
- පසුගිය දිනවල පැවැත්වූ ගොවි සංවිධාන ඇගයීම් පරීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කරණ ලදි.ව්‍යාපාරයේ කන්න කිහිපයක්ම එක දිගට වගාවක් සිදු නොවීම එයට ප්‍රධාන වශයෙන්ම හේතු වූ බවත් ලකුණු ලැබී ඇත්තේ ආයතන සංවර්ධනයට බවත් පවසන ලදි.තවද ගොවි සංවිධාන මට්ටමින් සිදු කරණ ලද විවිධ වැඩසටහන්වල ලිඛිත සාක්ෂි සහිතව සිදු කල යුතු බවත් ප්‍රකාශ කළේය.
- තවද නිලවරණවලදී නිලධාරීන් ඉවත් වන විට තමන් සතු ගොවි සංවිධානයට අයත් සියලු ලිපි ලේඛණ භාරදීම නියමිත පරිදි සිදු වී නොමැති බවත් ඉදිරියේදී එම තත්වයන් වෙනස් කර ගත යුතු බවත් පවසන ලදි.

- **ගොවි සංවිධාන අදහස් ඉදිරිපත් කිරීම**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | වගකීම | විසඳුම |
|---|---|---|---|
| ගරු සභාපති පාළුකඩවල යාය 05 ගොවි සංවිධානය පී.එම්.ලීලානන් ද වීරසිංහ මහතා | -ගොවි සංවිධාන ඇගයීම් වැඩසටහන ඉතා වැදගත් වැඩසටහනක් බවත් ඒ තුලින් ගොවි සංවිධානයේ පවතින අඩු පාඩු සම්පූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වන බවත් පවසන ලදි. | සං:නි/සං:සහ/ නේ:ව්‍යා:කළ. | එසේ කිරීම සුදුසු බව නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් පවසන ලදි. |

**03.වාරිමාර්ග කටයුතු - වාරිමාර්ග ඉංජිනේරු**

**අද දිනට ජලාශවල පවතින ජල තත්වය පහත සඳහන් පරිදි දැනුම් දෙන ලදි.**

| ජලාශය | ජල මට්ටම (අඩි) | අක්:අඩි |
|---|---|---|
| අඹකොළවැව | 15.10 | 6020 |
| අකරගල්ල | 15.5 | 3673 |
| පාළුකඩවල | 27 | 7500 |

- ගොවි සංවිධාන ඇගයීම් පරීක්ෂණය ඉතා සාර්ථක වැඩසටහනක් බවත් ගොවි සංවිධාන නිලධාරීන් ගොවි සංවිධානය පිළිබඳව මීට වඩා අවධානය යොමු කල යුතු බවත් අදාල නිර්නායක ගොවි සංවිධානයට ලබා දී අඩු පාඩු සකස් කරගත යුතු බවටත් දන්වන ලදි.
- ජලය භාවිතය ඉතා අරපිරිමැස්මෙන් යුතුව සිදුකල යුතු බවත් එසේ සිදු කිරීම තුලින් ඉදිරි යල් කන්නය සඳහා ජලය ඉතිරි කර ගැනීම සිදු කල හැකි බවත් පැවසීය.
  මෙම වන විට කීඩෑ උවදුර කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා පැතිරෙමින් පවතින බවත් වගාව ප්‍රවේශම් කරගත යුතු බවත් පවසන ලදි.
- 2018 වසරට අදාල නඩත්තු මුදල් පාළුකඩවල ගොවි සංවිධාන සඳහා රු86143 ක මුදලක්ද අකරගල්ල ගොවි සංවිධාන සඳහා රු.60362ක මුදලක්ද අඹකොලවැව ගොවි සංවිධාන සඳහා රු.35000 ක මුදලක්ද මේ වන විට ගෙවා අවසන් බව පවසන ලදි.

**ගොවි සංවිධානවල අදහස් යෝජනා හා තීරණ**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | වගකීම | විසඳුම |
|---|---|---|---|
| ගරු සභාපති පාළුකඩවල යාය 05 ගොවි සංවිධානය පී.එම්.ලීලානත් ද වීරසිංහ මහතා | -සියඹලංගමුව ඇළ කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් පවසන ලදී.. | වාරි:ඉංජි/ඉංජි:සහ: | ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරණ බවට වාරිමාර්ග ඉංජිනේරුතුමන් විසින් පවසන ලදී.. |
| ගරු ලේකම් අතරගල්ල ධාතුසේන ගොවි සංවිධානය ඩබ්.එම්.වික්‍රම සිංහ මහතා | -අංක 198 කුඹුරට අදාලව ඇළක් ඉදිකිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගැටළුවක් ඉදිරිපත් කිරීමට කුඹුරු ඉඩම් හිමියන් පැමිණ සිටින බවත් පවසන ලදී. | වාරි:ඉංජි/ඉංජි:සහ: | -මෙම ගැටළුවට අදාලව උසාවියේ විභාග වෙමින් පැවති නඩුව මේ වන විට අවසන් වී ඇති බවත් එම තීන්දුවට එහායින් යාමට නීතිමය අයිතියක් නොමැති බවත් පවසන ලදී. |

**03.ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම**
**කෘ:ප:නි:ස - අඹන්පොළ**

- සියලු ගොවීන්හට පොහොර සහනාධාර ලබා දීම අවසන් බව පැවසීය.
- වගා හානි ,ගංවතුර හානි,වල් අලින්ගෙන් වන හානි තිබේ නම් දැනුම් දෙන ලෙස පැවසීය.

වෙනත්-:

- පාළුකඩවල යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් 2018 වසරේදී ගොවි සංවිධාන කටයුතු වෙනුවෙන් කැප වී කම සේවාව ලබා දුන් සියලු රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන්ට ස්තුතිවන්ත වන බවත් යම් සිත් රිදවීමක් සිදුවූවානම් ඒ සඳහා සමාව ඉල්ලා සිටින බවත් පැවසීය.

  ඉහතින් සාකච්ඡාවට භාජනය වූ ගැටළුව ව්‍යාපාර කමිටුවේ තීරණය අවසන් තීරණය බව බවට පවසමින් අද දින ව්‍යාපාර කමිටුව සාර්ථකව පැවැත්වීම සඳහා සහයෝගය දුන් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් ප:ව 12.30ට පමණ ව්‍යාපාර කමිටුව අවසන් කළ අතර මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2019 ජනවාරි මස 17 වන දින පෙ:ව 9.00ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේදී පැවැත්වෙන බවටද සභාව දැනුවත් කරමින් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමන් විසින් රැස්වීමේ කටයුතු අවසන් කරණ ලදී.

නේවාසික ව්‍යාපාර කළමණාකරු
මී ඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

බී.එම්.කේ.එච් දිසානායක
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මීඔය/උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය,
ගල්ගමුව.

පිටපත්:-
01.දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල :-කාදැස
02.වාරිමාර්ග කළමනාකරණ අංශය කොළඹ :- කාදැස
03.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා